**මාතර මහා නගර සභාව**
**මාතර දිස්ත්‍රික්කය**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 04 දින මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ජංගම වත්කම් තුළ රු.169,360 ක ව්‍යාජ වත්කම් ඇතුළත්වී තිබුණි.

(ආ) ණයහිමි ශේෂය රු.7,508,872 කින්, ප්‍රාග්ධන වියදම රු. 7,411,746 කින් හා ණයගැති ශේෂය රු.97,126 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ) කර්මාන්ත 02 ක් සඳහා සහා අරමුදලින් ගෙවිය යුතු එකතුව රු.58,523,808 ක් වූ වියදම්, ප්‍රතිපාදන ලැබීම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඇ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබා ගෙන තිබුණු ණය මුදලේ හිඟ ශේෂය රු.107,918 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර, ඊට අදාළ රු.55,243,889 ක් වූ පොලිය ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) එකතුව රු.841,786 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ විනෝද බදු ආදායම රු.184,703 ක් හා ගෙවිය යුතු විදුලි ගාස්තු හා ජල ගාස්තු රු.666,096 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) මාතර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.1,942,225 ක මුදල ගෙවිය යුතු ගිණුම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඌ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතු එකතුව රු.43,550,598 ක් වූ දායක මුදල් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්
-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.288,477,942 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන /උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.18,305,109 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම
---------------------

නිරවුල් කිරීමට පියවර නොගෙන දිගින් දිගටම ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පැවති අවිනිශ්චිත ගිණුමේ වූ රු.157,496 ක හර ශේෂය 2015 වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කර තිබුණු අතර, අදාළ ගැලපීම් කිරීමකින් තොරව නැවත සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගතකර තිබුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.222,508,113 ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.28,691,163 ක් වූ ශේෂ 34 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.164,786,803 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.134,977,051 ක් වූ ශේෂ 26 ක් ඇතුළත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.113,421,281 ක් වූ ණය ප්‍රාග්ධන ශේෂය තුළ වසර 07 ක කාලයක් ඉක්මවූ රු.111,448,622 ක් වූ ශේෂ 03 ක් ඇතුළත්ව තිබුණි.

(ඈ) ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂයට ඇතුළත් රු.852,341 ක් වූ මැතිවරණ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.39,865,465 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයද, එකතුව රු.2,341,774 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථ, එකතුව රු.8,033,218 ක් වූ පොදු ගබඩා ශේෂ සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 156(1) හා 210(2) | ගෙවීම් ප්‍රමාද කිරීම හේතුකොටගෙන කිසියම් ගාස්තුවක් ගෙවීමට සිදුවුවහොත්, එම පාඩුව ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතු වුවද, විදුලි බිල් නිරවුල් කිරීම ප්‍රමාද කිරීම හේතුවෙන් ගෙවීමට සිදු වු රු.476,992 ක අධිභාර මුදල් සම්බන්ධයෙන් ඊට අදාළව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 570 හා 571 (1) (2) | වසර දෙකක කාලයක් ඉක්මවූ එකතුව රු.204,300 ක් වූ තැන්පත් ශේෂ 87 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතු වටිනාකම රු.4,672,890 ක් වූ පරිගනක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් 2003 වර්ෂයේ සිට පවත්වා නොතිබුණි. |

**1.3.7 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පළාත් පාලන කොමසාරිස්ගේ 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 දරන චක්‍රලේඛයේ 8.1 වගන්තිය වැරදි ලෙස අර්ථකථනය කර මුද්දර ගාස්තු ආදායම් එකතු කිරීම වෙනුවෙන් මහා නගර සභාවේ නිලධාරීන් 11 දෙනෙකුට රු.1,365,965 ක කොමිස් මුදල් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.116,367,859 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.65,804,015 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 50,563,844 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය ප්‍රතිඵලයේ රු.50,563,844 ක වර්ධනයට වෙනත් ආදායම් සහ ආදායම් ආධාර මුදල් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 75 ක් ඉක්ම වූ මුළු පුනරාවර්තන වියදම් පැවතීම නිසා සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) සභාවේ ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ දෙකෙහිද සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබූ අතර. ස්වයං උත්පාදිත ආදායම් මඟින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන තත්ත්වයක් පෙන්නුම් කෙරුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අයනොවී පවතින රු.28,691,163 ක ශේෂ පැවතීමෙන් ජංගම හා ක්ෂණික අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 වරිපනම්

ආරම්භක හිඟය රු.58,887,935 ක් වූ අතර, රු.36,963,058 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.95,850,994 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.38,673,395 ක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.57,177,598 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

### 2.4.2 කුලී ආදායම

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක හිඟය රු.44,041,863 ක් වූ අතර, රු.20,739,284 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.64,781,147 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.20,996,751 ක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.43,784,396 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) සභාව සතු පරණ තංගල්ල පාර නිවාස යෝජනා ක්‍රමයේ බදුකරුවන් 24 දෙනෙකුගෙන් රු.3,985,260 ක මුදලක් වර්ෂ 30 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. මෙම දේපළවල අයිතිය පදිංචිකරුවන්ගේ පෞද්ගලික නමට පවරාගෙන තිබුණි.

### 2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.114,280 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.119,474,040 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක වූ රු.10,858,969 ක් මුදල, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර අතිරේක ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ක්ෂේත්‍ර කම්කරු සේවිකාවන් ලෙස බඳවාගෙන තිබුණු කම්කරු සේවිකාවන් 15 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.5,196,930 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබූ නමුත්, ඔවුන්ගෙන් ප්‍රමාණවත් ක්ෂේත්‍ර රාජකාරි ඉටු කරවාගෙන නොතිබුණි.

(ඈ) ස්ථානමාරුවී ගිය , විශ්‍රාමගිය සහ මියගිය සේවකයින්ගෙන් හිඟව පවතින එකතුව රු.277,670 ක් වූ ණය ශේෂ 80 ක් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

### 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

ජල මනුවක සිදු වී තිබූ ජල කාන්දුව හඳුනා ගෙන අලුත්වැඩියා නොකිරීම නිසා රු.238,966 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ජල ගාස්තු වෙනුවෙන් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 37 ක් පුරවා ගැනීමට හා තෘතියික, ද්විතීයික හා ප්‍රාථමික තනතුරුවල වූ 127 ක අතිරික්ත සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) මෝටර් රථ හා කරත්ත

(i) සභාව සතු පිරිවැය රු.7,092,856 ක් වූ වාහන 02 ක් ඌන උපයෝජිතව පැවති අතර, තවත් වාහන 17 ක මයිලෝමීටර් අක්‍රීය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.3,631,351 ක ඉන්ධන වියදම් එම වාහන වෙනුවෙන් දරා තිබුණි.

(ii) සභාව විසින් භාවිතයෙන් ඉවත් කර තිබූ පිරිවැය රු.5,592,000 ක් වූ වාහන 07 ක් සම්බන්ධයෙන් 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ

සභාව සතු පිරිවැය රු.3,300,000 ක් වූ මාර්ග තලන යන්ත්‍ර දෙකක් අක්‍රීයව පැවතුණි.

(ඇ) අක්‍රීය බැංකු ගිණුම්

මහජන බැංකුවේ අංක 15182 දරන බැංකු ගිණුමේ පවතින රු.169,630 ක අක්‍රීය ශේෂය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.5 ඉදිකිරීම් කර්මාන්ත

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ඍජු ශ්‍රම පදනම යටතේ ඉදිකිරීම් සඳහා මිලදී ගෙන තිබූ ද්‍රව්‍යවලින් රු.5,577,524 ක් වූ ද්‍රව්‍ය විධිමත්ව නිකුත් කර නොතිබූ අතර, රු .696,015ක් වූ ද්‍රව්‍ය කර්මාන්ත සිදුකරන ස්ථානය සඳහන් කිරීමකින් තොරව ගබඩාවෙන් නිකුත් කර තිබුණි.

(ආ) මාර්ගයක මීටර් 600 ක් දිගට තාර දමා සංවර්ධනය කිරීම සඳහා පිරිවැය රු.410,808 ක් සහ පිරිවැය රු.1.789,428 ක් ලෙස ඇස්තමේන්තු දෙකක් අනුමත කර තිබුණි. පළමු ඇස්තමේන්තුවට වඩා දෙවන ඇස්තමේන්තුවේ මිල ගණන් සියයට 335 කින් වැඩි වී තිබුණි. අනුමත ප්‍රමාණය ඉක්මවා රු.248,132 ක් වූ ද්‍රව්‍යද අවිධිමත් ලෙස ගබඩාවෙන් නිකුත් කර තිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පාලනය

ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් ඍජු ශ්‍රමික පදනම යටතේ කර්මාන්ත 52 ක් ඉටු කිරීමට රු.20,860,241 ක් වූ ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද, ඉටු කර තිබුණු වටිනාකම රු.14,536,877 ක් වූ කර්මාන්ත 41 ක් වෙනුවෙන් නිමි වැඩ වාර්තා සකස් කර නොතිබුණි.

## 3.7 ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය

සභාවේ කසළ එකතු කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.103,918,785ක වියදම් දරා තිබුණි. 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන මත රු.13,598,762 ක වියදම් දරා ඉදිකර තිබූ කාබනික පොහොර මධ්‍යස්ථානය, පිහිටි ගොඩනැඟිල්ල, ජීව වායු නිෂ්පාදන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට 2011 වර්ෂයේ ලබා දී ඒ සඳහා රු.64,356,614 ක මුදලක් වැය කර ව්‍යාපෘතිය අතරමගදී අතහැර දමා තිබුණි. කාබනික පොහොර මධ්‍යස්ථානය ඉහත කරුණට යොදාගත් නිසා වාර්ෂිකව එකතු වන කසළ ටොන් 12,600 ක් අවිධිමත්ව බැහැර කර තිබුණි. අදාළ ඉඩම සඳහා 2014 ඔක්තෝබර් මාසයෙන් පසු පරිසර බලපත්‍රය ද ලබාගෙන නොතිබුණි.

### 3.8 පාරිසරික ගැටළු

2008ජනවාරි 25දිනැති අංක 16/1533දරන ගැසට් නිවේදනය මගින් කර්මාන්ත 25ක් සඳහා මහා නගර සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදිය යුතු බව දන්වා තිබුණි .ව්‍යාපාර බඳු ගෙවන කර්මාන්තවලට අයත් ව්‍යාපාර 161 න් ව්‍යාපාර 97 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු.426,800 ක ආදායම් අහිමිවී තිබුණි .

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 07 ක එකතුව රු.49,604,800 ක් වූ ඉතිරිවීම්ද, තවත් වියදම් විෂයයක රු.2,137,533 ක අහිතකර විචලනයද, ආදායම් විෂයයන් 02 ක ළඟා කර නොගත් ඉලක්කගත ආදායම් වල එකතුව රු.43,314,487 ක් ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.3 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. මහා නගර සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්ත කර තිබුණ නිලධාරීන් දෙදෙනාගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු.980,784ක් වැයකර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ගිණුම්කරණය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) අයවැය පාලනය